**උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතිය (වැඩසටහන් සංරචකය) - 2022**

---

උසස් අධ්‍යාපනය පුළුල් කිරීම සහ සංවර්ධනය කිරීම වේගවත් කිරීමේ ව්‍යාපෘතියේ (වැඩසටහන් සංරචකය) 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය උදෙසා වන ජාත්‍යන්තර බැංකුව සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2017 ජූලි 17 දින එළඹි අංක 8743 එල්කේ දරන ණය ගිවිසුමේ හා අංක 6026 එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ 4.09(ආ) ව්‍යවස්ථා සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය හා මූල්‍ය ගිවිසුම්වලට අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ අධ්‍යාපන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර රජයේ විශ්වවිද්‍යාල සහ ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ අමාත්‍යාංශය සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. (විද්‍යාව, තාක්ෂණය, ඉංජිනේරු සහ වෛද්‍ය අංශ) ප්‍රමුඛ විෂයයන්ට රජයේ විශ්ව විද්‍යාලවලට, ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතන, උසස් තාක්ෂණික ආයතන සහ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතනවලට ඇතුළත්වීම වැඩිකිරීම, උපාධි වැඩසටහන්වල ගුණාත්මකබව වැඩිදියුණු කිරීම හා උසස් අධ්‍යාපන අංශයේ පර්යේෂණ හා නව සොයා ගැනීම් දිරිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය සහ මූල්‍ය ගිවිසුම්වලට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 18,136කට සමාන එජඩො මිලියන 100 මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 මාර්තු 01 දින ආරම්භ කරන ලද අතර 2023 ජූනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා එහි මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ල.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම,මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ වගකීම් සහ පාලනය භාරව සිටින අයගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුලත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් අනාවරණය කරගන්නා

බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි., තවද

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිත කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

| නීති රීති සහ රෙගුලාසි වෙත යොමු කිරීම | අනුකූල නොවීම/ විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|
| මූල්‍ය රෙගුලාසි 507(2) සහ 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 වැනි ඡේදයේ 3.1.7 සහ 3.2.7 වගන්තිවල දක්වා ඇති විධිවිධාන. | 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලය තුළ රු.මිලියන 2.671කට මිලදී ගත් අයිතමයන් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ වාර්තා විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 සිට 2022 දක්වා කාලය තුළ රාජ්‍ය විශ්වවිද්‍යාල 16යේ තිබෙන OTS හරහා ලබා ගත් සියලුම භාණ්ඩ හා උපකරණ සෘජුවම විශ්වවිද්‍යාල වෙත ලබා දෙන ලදී. විශ්වවිද්‍යාල විසින් මෙම අයිතම ඇතුළත් සමීක්ෂණ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන බව. | මුදල් රෙගුලාසි වලට අනුකූල විය යුතුය. |

## 3. භෞතික කාර්යයසාධනය

### 3.1 ව්‍යාපෘති පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | AHEAD ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ව්‍යාධි විද්‍යා අංශය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකුට රු. මිලියන 139 ක (වැට් රහිත) කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කරන ලදී. 2022 පෙබරවාරි 25 දින ආරම්භ වූ කොන්ත්‍රාත්තුව 2022 අගෝස්තු 31 දින අවසන් කිරීමට නියමිතව තිබුණි. 2022 අගෝස්තු 31 සහ 2022 දෙසැම්බර් 31 යන දිනවලදී නිම කරන ලද වැඩ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 38ක් සහ සියයට 65ක් විය. විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් ඉදිකිරීම් කාලය 2023 අප්‍රේල් 30 දක්වා දීර්ඝ කර තිබුණද, 2023 මැයි 31 වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුගේ මන්දගාමී ප්‍රගතිය මෙයට හේතුව විය. ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟය, ශ්‍රම හිඟය සහ මිල ඉහළ යාම ද ප්‍රගතිය අඩුවීම කෙරෙහි බලපා ඇති බව. | ප්‍රමාදයන් වලක්වා ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතු අතර අමතර වියදම් වලක්වා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුවේ වැඩ නියමිත වේලාවට අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විදේශ විශ්වවිද්‍යාලවල ආචාර්ය උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අපේක්ෂකයින් 17 දෙනෙකු වෙනුවෙන් මුළු වියදම ලෙස රු. මිලියන 118 ක් වැය කර තිබුණි. අධ්‍යයන කාර්යය මණ්ඩලයේ අට දෙනෙකු ඔවුන්ගේ ආචාර්ය උපාධිය/පශ්චාත් උපාධිය සම්පූර්ණ කර 2022 දෙසැම්බර් 31 හෝ ඊට පෙර විශ්වවිද්‍යාලයට පැමිණීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ඔවුන්ගේ අධ්‍යයන වැඩසටහන් අවසන් කිරීමට සහ නැවත විශ්වවිද්‍යාලය වෙත පැමිනීමට ඔවුන් අපොහොසත් වී තිබුණි. | Covid 19 හේතුවෙන් රටවල් වසා දැමීමේ තත්ත්වය සහ සංචාරක සීමාවන් නිසා ආචාර්ය උපාධිලාභීන්ට සැලසුම් කළ පරිදි ඔවුන්ගේ අධ්‍යයන කටයුතු කරගෙන යාමට නොහැකි වූ බව. | අපේක්ෂකයින් සැලසුම් කළ කාල රාමුව තුළ ආචාර්ය උපාධි සම්පූර්ණ කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අපේක්ෂකයින් 16 දෙනෙකු සඳහා ඔවුන්ගේ ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා වසර දෙකක කාලයක් වෙනුවෙන් රු. මිලියන 129ක් වැය කර ඇති අතර, ඔවුන් එම වැඩසටහන් 2022 දෙසැම්බර් 31 වන විට අවසන් කිරීමට නියමිතව තිබුණද ඒ අනුව අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | අපේක්ෂකයින් 16 දෙනෙකුගෙන් අපේක්ෂකයින් දෙදෙනෙකු වැඩ භාරගෙන ඇත. අපේක්ෂකයින් තිදෙනෙකු විශ්වවිද්‍යාලයෙන් ඉල්ලා අස්වී තිබේ. ඉතිරි අපේක්ෂකයින් අදාළ පරිපාලන අංශවලින් දින දීර්ඝ කිරීම් සඳහා සහ නිවාඩු අනුමත කිරීම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් කර ඇති බව. | අපේක්ෂකයින් සැලසුම් කළ කාල රාමුව තුළ ආචාර්ය උපාධිය සම්පූර්ණ කළ යුතුය. |

**3.2 ඌන උපයෝජිත සම්පත්**

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ඉංග්‍රීසි ක්‍රියාකාරකම් වැඩසටහන සඳහා වටිනාකම රු. මිලියන 3ක් වූ මේස පරිගණක 10ක් (desktop computers) සහ රු. 505,132ක් වටිනා ලී බඩු හා උපකරණ මිලදී ගෙන තිබුණ ද ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් 2023 ජනවාරි 3 වන දින දක්වා එම උපකරණ ඌන උපයෝජිතව පැවතුණි. | එම ගැටලුවට විසඳුම් ලබාදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨයේ අදාළ ගොඩනැඟිල්ලේ ඉදිකිරීම් අවසන් කර සම්පත් ප්‍රයෝජනයට ගෙන ඇති බව. | මිලදී ගත් උපකරණ අදාළ වැඩසටහන භාවිතා කළ යුතුය. |